# ඇබෑර්තු

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
## (පූර්ණ රජය සතු සමාගමකි)

## කර්මාන්ත අමාත්‍යාංශය

අප සමාගමේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පරිපාලන (තනතුරු 01) - කොන්ත්‍රාත් පදනමින්

**1.1 සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**බාහිර :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණ හෝ ව්‍යාපාර පරිපාලන හෝ ව්‍යාපාර කළමනාකරණ ප්‍රථම උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස් සුදුසුකම්) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළව ආශ්‍රිත සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ තලයේ"** අවම වසර 15 ක පළපුරුද්ද

2) පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළව පූර්ණ සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ තලයේ"** අවම වසර 15 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**අභ්‍යන්තර :**

01. බාහිර අයදුම්කරුවන් වෙතින් අවශ්‍ය ඉහත සඳහන් සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**1.2 වැටුප් පරිමාණය :**

HM 1-1 - 2016 රුපියල් (80,295 - 15 x 2,270 - 114,345)

**1.3 වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### 02. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මූල්‍ය (තනතුරු 01) - කොන්ත්‍රාත් පදනමින්

**2.1 සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**බාහිර :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණ මූල්‍ය හෝ මූල්‍ය කළමනාකරණ (B.com) ප්‍රථම උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ තලයේ"** අවම වසර 15 ක පළපුරුද්ද

2) තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ තලයේ"** අවම වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**අභ්‍යන්තර :**

01. බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත ඉහත සඳහන් සුදුසුකම් ලබා තිබීම
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM) I ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**2.2 වැටුප් පරිමාණය :**

HM 1-1 - 2016 රුපියල් (80,295 - 15 x 2,270 - 114,345)

**2.3 වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**සෑම අයදුම්කරුවකුම**

i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii) තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකිවනසේ මනා මානසික හා ශාරීරික සුවතාවයෙන් යුක්ත විය යුතුය.
iii) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**සැලකිය යුතු :**

මෙම සියලුම ඇබෑර්තු පවතින්නේ කුරුණෑගල, දෙඩන්ගස්ලන්ද, මදුරාගොඩ මිහිටි මිනිරන් පතල් පරිශ්‍රයේය.

**වෙනත් ප්‍රතිලාභ :**

01. සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් තම වැටුපෙන් 10% ක දායකත්වයක් දැරිය යුතු අතර, සේවායෝජක විසින් ඒ සඳහා 15% ක දායකත්වයක් දරනු ඇත. (එයට 3% ක සේවක භාර අරමුදල සඳහා වන දායකත්වය ඇතුළත්ය) එසේම, ජීවන අංක දීමනාව, සංචාරක දීමනාව හා අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් රජයේ චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ. දෛනික පැමිණීම මත ගෙවනු ලබන ආහාර දීමනාව, සේවක රක්ෂණ යෝජනා ක්‍රමය හා නිෂ්පාදනය මත ගෙවන දිරිදීමනා යෝජනා ක්‍රමයද මෙම ප්‍රතිලාභවලට අයත්ය.
02. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ.
03. කරුණාකර, ඔබගේ අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනය වෙත 2022.03.20 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්,**
**561/3, ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ 05.**